@@@ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2062/35 - 2018 මාර්තු මස 16 වැනි සිකුරාදා - 2018.03.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මාගේ අංකය* : ARA/LND/ACQVI/D3/45
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ අංකය* : 4-3/15/2016/VE/449.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 07 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර* :

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදපත්තුව සුළු කොට්ඨාශයේ අංක 33 සී රුවන්දෙණිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පල්ලේ පමුණුව ගමේ පිහිටි ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් 2017.03.30 දිනැතිව පිළියෙල කරන ලද අංක මු. පි. කැ. 3555 දරන මුලික පිඹුරේ කැබලි අංක 01, 03 හා 05 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2.0679 පමණ වූ උඩවිහාරේතැන්න හා නිතුලේකුඹරේ හේන නැමැති ඉඩම්.

**කැබලි අංක 01**
ඉඩමේ නම: උඩවිහාරේ තැන්න; විස්තරය: ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38(අ) වන වගන්තිය යටතේ පවරා ගන්නා ලදි; මුල් හිමිකම් පාන්නා: අංක ඩී 1/6හි, දෙවනගල, දම්පෙහේන, රුවන්දෙණිය පදිංචි එච්. පී. තිලකරත්න, අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා; ප්‍රමාණය: හෙක්. 1.2121

**කැබලි අංක 03**
ඉඩමේ නම: උඩවිහාරේ තැන්න; විස්තරය: ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38(අ) වන වගන්තිය යටතේ පවරා ගන්නා ලදි; මුල් හිමිකම් පාන්නා: අංක ඩී 1/6හි, දෙවනගල, දම්පෙහේන, රුවන්දෙණිය පදිංචි එච්. පී. තිලකරත්න, අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා; ප්‍රමාණය: හෙක්. 0.0223

**කැබලි අංක 05**
ඉඩමේ නම: නිතුලේකුඹුරේ හේන; විස්තරය: ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38(අ) වන වගන්තිය යටතේ පවරා ගන්නා ලදි; මුල් හිමිකම් පාන්නා: දෙවනගල, රුවන්දෙණිය හි පදිංචි එන්. සේනාරත්න සහ තවත් අය අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා; ප්‍රමාණය: හෙක්. 0.8335

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018 අප්‍රේල් මස 19 වැනි දින පෙ. ව. 10.00ට අරණායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 27301 - 47 (2017/03)

තව ද, 2018 අප්‍රේල් මස 12 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඉසෙඩ් ඒ. එම්. ෆයිසල්,
ප්‍රාදේශීය ලේකම්,
අරණායක.

2018 මාර්තු මස 13 වැනි දින,
අරණායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

03– 1325

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4-3/15/2014/L/301.
*යොමු අංකය* : KMB/LAN/ACQUI/02/76

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/ පරවශතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 07 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර* :

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 330 කඹුරුපිටිය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මු.පි. මාර 2703හි පෙන්නුම් කරන පහත සඳහන් ඉඩම් කොටස,

**කැබලි අංක 01**
ඉඩමේ නම: රටලංකාවත්ත; විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්. 0.0996

**කැබලි අංක 02**
ඉඩමේ නම: රටලංකාවත්ත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ළිඳක් ඇත; හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්. 0.0016

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018 අප්‍රේල් මස 02 වැනි දින පෙ. ව. 9.30ට කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2018 මාර්තු මස 28 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එන්. එච්. එම්. ඩබ්. ඩබ්. එන්. හේරත්,
ප්‍රාදේශීය ලේකම්,
කඹුරුපිටිය.

2018 මාර්තු මස 12 වැනි දින,
කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

03– 1326

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : ඊඑච්ඊ/ඩීඑස්/එල්එන්ඩී/05/ජීසීකිව්/ආර්ඩීජී/ ඩීඊඕ/01-375.
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය* : 4-3/5/2013/එච්ඩබ්/439.

උක්ත කරුණ සම්බන්ධයෙන් අංක 2009/17 දරන 2017.03.07 දිනැති අවසාන ගම් පිඹුරු අංක 691, අතිරේක අංක 18, පත්‍ර අංක 16 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 11A පිටුවෙහි සඳහන් කරුණු පහත පරිදි සංශෝධනය විය යුතු බව කාරුණිකව දන්වමි.

ඒ අනුව, එහි අනු අංක 45 යටතේ දැක්වෙන කැබලි අංක 244, කැබලි අංක 245 ලෙස පහත පරිදි නිවැරදි විය යුතු ය.

45. **කැබලි අංක 245**
ඉඩමේ නම: කැලේගහහේන; ඉඩමේ විස්තරය: වත්ත, මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: ඇහැලියගොඩ, පනාවල පාර, අංක 19හි පදිංචි ජී. කේ. සිරිපාල කිරිඇල්ල; ප්‍රමාණය: හෙක්. 0.0005

ආර්. එච්. එස්. දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
ඇහැලියගොඩ.

2017 මාර්තු මස 09 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

03– 1327

---

ශුද්ධි පත්‍රිකාව

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : 3/2/3/10/245(iv).

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියට යටත්ව අංක 1822/23 හා 2013.08.08 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද

දැන්වීමේ 4A පිටුවේ සඳහන් ගම 3891හි සඳහන් කැබලි අංක 86 මැනුම් සංශෝධනය පරිදි කැබලි අංක 250, 251 සහ 252 ලෙස විභජනය වී ඇති අතර ඒ අනුව කැබලි අංක 86ට අදාළ ඡේදය පහත පරිදි සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

**කැබලි අංක 250**

ඉඩමේ නම: හොරගොල්ලවත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: තිහාරිය, කළගෙඩිහේන, මුදලිගම මාවත, අංක 42/එස් හි පදිංචි ඩබ්ලිව්. සුදේශ් ඉඳුනිල් ෆොන්සේකා; ප්‍රමාණය: හෙක්. 0.0086කි.

**කැබලි අංක 251**

ඉඩමේ නම: හොරගොල්ලවත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: තැළණිය, දළුගම, කොහොල්විල පාර, අංක 677සී හි පදිංචි පී. හද්‍රා මල්කාන්ති; ප්‍රමාණය: හෙක්. 0.0092කි.

**කැබලි අංක 252**

ඉඩමේ නම: හොරගොල්ලවත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0221කි.

එස්. පී. ගුණවර්ධන,
ප්‍රාදේශීය ලේකම්,
අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2018 මාර්තු මස 05 වැනි දින,
අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

03– 1328